# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## නිවාඩු කාලීන පැවරුම්

## සැකසුම-මාවනැල්ල අධ්‍යාපන කලාපය

# 5 ශ්‍රේණිය - පරිසරය(තෙවන සතිය )

**14 තේමාව - අපට කළ හැකි වෙනස්කම්**

**වාචික පිළිතුරු ලබා දෙන්න.**

1. .ඔබ දිනපතා කරන වැඩකටයුතු සිහිකරන්න.ඔබ උදේ අවදි වූ මොහොතේ සිට නින්දට යන මොහොත දක්වා ඔබේ හැසිරීම මතකයට නගා ගන්න.එම හැසිරීම් වලින් එකක් තෝරාගෙන යහපත් වෙනස්කමක් ඇති කර ගන්න.
   “මම හෙට සිට මගේ හැසිරීම ඒ අයුරින්ම වෙනස් කරගන්නවාමයි” අධිෂ්ඨාන කරගන්න.
   යහපත් චර්යා පවත්වා ගැනීමට සුදුසු (ගද්‍ය/පද්‍ය/චිත්‍ර/පෝස්ටර්) නිර්මාණයක් කරන්න.

2. ඔබට පාසලේ තෝරාගත් ස්ථානයක් සුන්දරත්වය සහිතව වෙනස් කිරීම දැන් අපහසුයි නේද? නමුත් නිවාස ආශ්‍රිත පරිසරයේ තෝරාගත් ස්ථානයක් සුන්දරත්වය සහිතව වෙනස් කිරීම දැන් කරන්න.පාසලට පැමිණි පසු ඒ පිළිබඳව කියන්න.

3. පාසලින් බැහැරව ඔබට උදව් කළ හැකි පුද්ගලයින්, අවස්ථා මොනවාද?

.

**ලිඛිත පිළිතුරු ලබා දෙන්න.**

4. අප නිවෙස් වලින් බැහැර කරන අපද්‍රව්‍ය පහත දක්වා ඇත. ඒවා පහත වගුව තුල වගුගත කරන්න.

   **( CFL බල්බ්, භාවිතා කරන ලද බැටරි, යෝගට් කෝප්ප, ඉවත දමන එළවළු, ඉවත දමන ආහාර, ප්ලාස්ටික්, කඩදාසි, රබර්,වීදුරු, පත්තර, පොලිතින්, භාවිතයෙන් ඉවත්කළ ජංගම දුරකථන,පරිගණක උපාංග)**

| පරිසරයට ක්‍රමවත්ව බැහැර කළහැකි අපද්‍රව්‍ය | එකතු කරන මධ්‍යස්ථාන වලට ගෙන ගොස් භාරදෙන අපද්‍රව්‍ය |
|---|---|
| | |